# උත්සහවන්ත යහළුවෝ




ආර්.බී. විශ්මි ආකර්ශා

# උත්සහවන්ත යහළුවෝ

ආර්.බී. විශ්මි ආකර්ශා

3 ශ්‍රේණිය E

මහ/මහමායා බාලිකා විද්‍යාලය

කතාව සහ චිත්‍ර

ආර්.බී. විශ්මි ආකර්ශා

ISBN 978- 624-208-254-7

කෘතිය පළ කරන දින

2025.02.08

**කතෘගේ වෙනත් කෘති**

**නපුරු කුඩම්මා**

කතෘ ප්‍රකාශනයකි

2025

# පිදුම

සිත් සතර කියා දුන්

මානෙල් වික්‍රමනායක

ගුරුතුමියටත්

සියලුම ගුරුමෑණිවරුන්ටත්

ගුරු පියවරුන්ටත්

දෙමාපියන්ටත්

මාගේ යෙහෙළියන්ටත්

ඉතා ආදරයෙන්

මෙම ග්‍රන්ථය

පුදකරමි....

# පෙරවදන

සාහිත්‍ය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධමත් කාලපරිච්ඡේද නිසාය. එසේනම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කර ගැනීමට අප ගත් කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදී කතෘ කරදන අත්ථදස්සී මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භිකෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන "හෙරණගත්කරණී" ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.


මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,


මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

එකමත් එක රටක සවිදු ජනිදු කියලා යාළුවො දෙදෙනෙක් හිටියා. මේ යාලුවෝ දෙන්නට කවුරුත් කතා කළේ අඹ යාලුවෝ කියල. ඒ තරම්ම හොඳ යාලුවෝ දෙදෙනෙකි.




සවිඳුගේ අම්මයි තාත්තයි ගුරුවරුය. සවිඳු දෙමව්පියන්ට කීකරු දරුවෙක්.

සවිඳු උදෑසනම අම්මා තාත්තා සමග පාසැල් යාමට පුරුදු වී සිටියා. පාසලේ යාලුවෝ  සවිඳු එනතුරා මග බලාසිටිනවා. යාළුවෝ හැමෝම සවිඳු ට ගොඩක් ආදරෙයි.



සවිඳුගේ යාළුවා ජනිඳුගේ අම්මයි, තාත්තයි වෛද්‍යවරුන්ය. ජනිඳු පාසැල් යන්නේ කාර් රථයේය.



ජනිඳු පාසලට එනවා දුටු යාලුවෝ කාර් රථය
වෙත දිව එන්නේ ජනිඳු පිළිගැනීමට මෙන්ය.
සවිඳුට වගේම යාළුවො ජනිඳුටත් ගොඩක්
ආදරය කළා.
පාසලේ හැමෝම කතා කලේ මේ යාලුවෝ
දෙන්නාගේ එකමුතුකම ගැනය.

පාසල නිම වී නිවසට ගිය යහළුවෝ දෙදෙනා සවිඳුගේ ගෙදර වත්ත පහළ සෙල්ලම් කළා.



බෝල ගසමින් සිටිය යාලුවෝ දෙදෙනාගෙන්
එක් අයෙක්ට බෝලය අල්ලා ගැනීමට නොහැකි
වී බෝලය ඈතට පෙරළී ගියාය.
බෝලය පිටුපසින් යාළුවෝ  දිව්වේය.
පෙරළී පෙරළී ගිය බෝලය වත්ත පහළ තිබූ
කොස් ගස ළඟ නතර විය



සවිඳු බෝලය අහුලා ගන්නා විට බෝලය තිබූ තැනින් වතුර උඩට එනවා දුටුවා. ජනිඳු ජනිඳු මෙතන වතුර තිබෙනවා යැයි සවිඳු කතා කළා. ජනිඳු දුවගෙන ආවා. පොළොව ගොඩක් තෙත  වෙලා වතුර පොළොව ඇතුළෙන් එනවා. සවිඳු අපි පොළොව කොටලා බලමුද ජනිඳු කිව්වා.

ජනිඳු ගෙදරට දුවලා ගොස් උදැල්ලක් ගෙනාවා. යාළුවෝ දෙන්නා වතුර තිබෙන තැන කොටන්න පටන් ගත්තා.



යාළුවෝ දෙන්නා ගොඩක් මහන්සි වී පොළොව කෙටුවා. පොළොව කොටන කොටන විට ගල් හමු වුනා. දෙදෙනාම ගල් ගොඩ ගසමින් පොළොව කෙටුවා.

අපිට පුළුවන් මෙතන ගැඹුරට කපා ළිඳක් හදන්න ජනිඳු කිව්වා. ඔව් ජනිඳු අපි පුළුවන් තරම් ළිඳ කපමු. දෙදෙනාගේ උත්සාහය නිසා ගැඹුරට ළිඳ කැපුවා. ටිකෙන් ටික සැන්දෑ වුණා. දෙදෙනාම නිවෙස් කරා පිටත් වුණා.

ගෙදර ගිය සවිඳු ජනිඳු සිදුවූ සියල්ල දෙමව්පියන්ට කිව්වා. පසුවදා උදෑසනම සවිඳුගේත් ජනිඳුගේත් දෙමව්පියෝ ළිඳ කපපු තැනට ආවා. යාළුවෝ දෙන්නාගේ උත්සාහය නිසා ළිඳක් කපන්න තැනක් ලැබිලා. සවිඳුත් ජනිඳුත් කැපු ළිඳ වටේට ගල් බැඳ ලස්සන ළිඳක් සෑදීමට දෙමව්පියන් උදව් කළා.

යාළුවෝ දෙන්නාගේ උත්සාහය නිසා ගමේ හැමෝටම වතුර ගන්න ළිඳක් ලැබුනා. දෙදෙනාගේම දෙමාපියන් මේ ක්‍රියාව ගැන ගොඩක් සතුටු උනා.





# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල් වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩනැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කරන ක්‍රියා මූලික පර්යේෂණ ව්‍යාපෘති යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍යය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල් වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන් , දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමි විය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින් වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩා කර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මකව සනාථ වෙයි.මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනා කර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමඟ ගලපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමඟ එක්ව විද්‍යුත් කෘති රචනා කරයි තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙන යාමට මහාමායා බාලිකාවියන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසග, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,

සෙනවිරත්න මහලේකම්

ISBN 978-624-208-254-7